සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

08 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 15 S I

# ක්‍රිස්තියානි ධර්මය - I

කාලය පැය දෙකයි

නම හා විභාග අංකය:

සැලකිය යුතුයි :-
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 - 20 දක්වා සියලුම ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

1. දෙවියන් වහන්සේ ගේ ස්වරූපය හා සමානත්මතාවය අනුව මිනිසා මවන ලද බව සඳහන් කරන ශුද්ධ බයිබල් ග්‍රන්ථය වනුයේ,
(i) උත්පත්ති (ii) නික්මයාම (ii) ගීතාවලිය (iv) එළිදරව්ව

2. දෙවියන් වහන්සේ විසින් තෝරා ගනු ලැබූ ජනතාව වූ ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ වහලුන්ව සිටි කාලය වනුයේ,
(i) වසර 300 කි (ii) වසර 330 කි (iii) වසර 400 කි (iv) වසර 430 කි

3. පාළුකරයේ ගමන තුළ ඊශ්‍රායෙල් ජනතාවට දෙවියන් වහන්සේ කරදිය මිරිදිය බවට පත්කොට බොන්නට ලබා දුන් ස්ථානය වනුයේ,
(i) සීන් පාළුතරය (ii) මාරා (iii) මස්සා සහ මෙරීබා (iv) රෙපීඩිම්

4. මිනිස් ජීවිතය සදාකාලික නොවන නමුත් මිනිසා කෙරෙහි ................................ සදාකල් පවතී. මෙහි හිස්තැනට ගැළපෙන පිළිතුර වනුයේ,
(i) දේව ගරු බිය (ii) දේව ප්‍රේමය (iii) දේවානාවරණය (iv) දේවානු භාවය

5. අයකැමියෙකු ලෙස බදු පොලේ සිටියදී කැඳවීම ලැබූ ගෝලයකු වන්නේ,
(i) ශු. පේදුරු තුමා (ii) ශු. ජොහාන් තුමා (iii) ශු. ජාකොබ් තුමා (iv) ශු. මතෙව් තුමා

6. දේව රාජ්‍යය නොපිළිගන්නා අයට සාමය අහිමි වන අතර, එම නුවර වලදී පාද වල දූවිලි ගසා දැමීමට ධර්මදූතයන්ට ජේසුස් වහන්සේ අණ දීමෙන් සංකේතවත් වනුයේ,
(i) සාධාරණත්වය (ii) මරණින් මතු ජීවිතය (iii) දේව විනිශ්චය (iv) යුගාන්ත දඬුවම

7. ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර තුළ නිරන්තරයෙන් සඳහන් වන ''ගලීල මුහුද' සුභාරංචි ග්‍රන්ථ වල හඳුන්වන තවත් නාමයක් වනුයේ,
(i) මළ මුහුද (ii) මධ්‍යධරණී මුහුද (iii) තිබේරියස් මුහුද (iv) රතු මුහුද

8. වැරදි ඉගැන්වීම් වලින් මුලා නොවන පිණිස සත්‍යය දේව ධර්මය හඳුනා ගැනීම හා හඳුන්වා දීම පිණිස අප ලබන ශුද්ධාත්ම දීමනාව වනුයේ.
(i) උපදෙස් දීමේ ප්‍රඥාව (ii) ධර්මය පහදා දීමේ ඥානය
(iii) දිවැස් වැකි කීමේ බලය (iv) ආත්ම විමසීමේ හැකියාව

9. ගලාති 5: 22-26 ට අනුව ශු. පාවුළු තුමා අපට උගන්වනු ලබන ශුද්ධාත්ම ඵල ගණන වනුයේ,
(i) 7 කි (ii) 9 කි (iii) 12 කි (iv) 16 කි

10. ''අයහපත් වූ ඔබ ඔබේ දරුවන්ට යහපත් දේ දෙන්නට දන්නා වූ නම් ඊට කොපමණ වැඩියෙන් ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ තමන් වහන්සේගෙන් ඉල්ලන්නන්ට ශුද්ධාත්මයාණන් නොදෙන සේක්ද'' නව ගිවිසුමේ ලූක් සුභාරංචිය තුළ මෙලෙස පවසනු ලබන්නේ,
(i) ජේසුස් වහන්සේ (ii) පේදුරු තුමා (iii) පාවුළු තුමා (iv) ස්නාවක ජොහාන් තුමා

11. කිතුනු දරුවන් වන අප දෙවි පියාණන් සමග ඇති කර ගනු ලබන ගැඹුරු සම්බන්ධතාව මගින්
(i) ආර්ථිකය වර්ධනය කර ගත හැක. (ii) සමාජීය ජීවිතය වර්ධනය කර ගත හැක
(iii) සංස්කෘතික වටිනාකම් වර්ධනය කර ගත හැක (iv) අධ්‍යාත්මික ජීවිතය වර්ධනය කර ගත හැක.

12. කුඩා දරුවෙකු දෙවි පියාණන් පිළිබඳ තම ප්‍රථම අත්දැකීම ලබනුයේ,
(i) තම පවුල තුළිනි (ii) තම පාසල තුළිනි (iii) තම මිතුරන් තුළිනි (iv) තම දෙව් මැඳුර තුළිනි

13. ජේසුස් වහන්සේ ගේ දූත සේවා සමයේ පලස්තීනය යටත් කරගෙන සිටි අධිරාජ්‍යය වනුයේ,
(i) මිසර අධිරාජ්‍යය (ii) අසිරියානු අධිරාජ්‍යය (iii) ග්‍රීක අධිරාජ්‍යය (iv) රෝම අධිරාජ්‍යය

14. ''ඔබ අතුරින් පවක් නැති තැනැත්තා පළමු කොට ඇයට ගලක් ගසන්න'' ජේසුස් වහන්සේ මෙලෙස පවසන ලද්දේ,
(i) සමරිතානු ස්ත්‍රීය පිළිබඳ සිදුමේදී ය. (ii) පව්කාර ස්ත්‍රීය පිළිබඳ සිදුවීමේදී ය.
(iii) සළුවට අත ගැසූ ස්ත්‍රීය පිළිබඳ සිදුවීමේ දී ය. (iv) නායිම් නුවර වැන්දඹුව සම්බන්ධ සිදුවීමේ දී ය.

15. අපගේ සියලු බලාපොරොත්තු සුන්ව ගිය අවස්ථාවකදී වුවද ජේසුස් වහන්සේ කෙරෙහි අප තබන විශ්වාසය මහත් පුදුම දේ කළ හැකි බව අපට සිහි ගන්වන සිදුවීමකි.
(i) ජේසුස් වහන්සේ ලාදුරු රෝගීන් සුවපත් කිරීම. (iii) අංශභාග රෝගියා සුව කිරීම.
(ii) ජායිරස්ගේ දියණිය මරණින් නැගිටුවීම. (iv) බෙතෙස්දා පොකුණ අසල කොර පුද්ගලයා සුව කිරීම.

16. ''මනුෂ්‍යයින්ගේ ජීවිත වලට සමීප වන්න. එවිට ජේසුස් වහන්සේගේ හඬ ඇසේවි.'' යන අදහස තුළ මෙරට දූත සේවයේ යෙදුනු විශිෂ්ඨ පියතුමෙකි.
(i) සේවක සැමුවෙල් සෙල්වරත්නම් තුමා (ii) ගරු මයිකල් රුද්‍රිගෝ පියතුමා
(iii) අති ගරු ඇන්ඩෲ කුමාරගේ හිමිපාණෝ (iv) ගෞරවනීය සෝමසිරි කුමාරදාස දේව ගැති තුමා

17. පැරණි ගිවිසුමේ පළමු පොත් කාණ්ඩය වන ''පංච පුස්තකය'' හීබෲ භාෂාවෙන් හඳුන්වන නාමය වනුයේ,
(i) ටෝරා (ii) බෙසෝරා (iii) කෙටුබිම් (iv) නබිර්ම්

18. ඊශ්‍රායෙල් ඉතිහාසය තුළ ආදී පිය යුගය ලෙස හැඳින්වෙන්නේ,
(i) ක්‍රි.පූ. 2000-1700 (ii) ක්‍රි.පූ. 1700-2000 (iii) ක්‍රි.පූ. 2000- ක්‍රි.ව. 1700 (iv) ක්‍රි.පූ. 1500-1700

19. ආබ්‍රහම් ගේ පෙර නාමය වූ ''ආබ්‍රම්'' යන්නෙහි අර්ථය වනුයේ,
(i) ජාතින්ගේ පියා (ii) උතුම් පියා (iii) විශ්වාසයේ පියා (iv) සාමයේ පියා

20. ''මා නුඹ කුසෙහි පිළිසිඳ ගැනීම ඇති කරන්නටත් පෙර පටන් මම නුඹ හඳුනාගතිමි. නුඹේ උපතට පෙර මම නුඹ කැප කළෙමි.'' මෙලෙස කැඳවීම් ලැබූ දිවැසිවරයා වනුයේ,
(i) ජෙරමියා (ii) නෙහෙමියා (iii) සෙකරියා (iv) ශෙපනියා

## ක්‍රිස්තු ධර්මය - II

**ප්‍රශ්න 06 කට පමණක් පිළිතුරු සපයන්න.**

1. (i) උත්පත්ති 2:9 ට අනුව දෙවියන් වහන්සේ පොළවේ හට ගන්නට සැලැස්වූ විශේෂ ගස් වර්ග 2 ලියන්න.
(ii) ලොව මවා වදාළ දෙවියන් වහන්සේ මිනිසාගේ පාලනයට යටත් කළ මැවිලි 3 ක් ලියන්න.
(iii) දේව මැවිල්ල තුළ ඔබගේ ජීවිතය වටින බව පවුල, පාසල හෝ දෙව් මැදුර තුළ ඔබ අත්දකින්නේ කෙසේදැයි කරුණු 5 ක් ලියන්න.

2. (i) ඊශ්‍රායෙල් ජනතාව පාළුකරයේ ගමන තුළ දෙවිසමිඳුන්ගෙන් ලද ආහාර වර්ග 2 ලියන්න
(ii) මිසරයේ පාරාවෝ රජතුමා ඊශ්‍රායෙල්වරුන් මර්ධනයට ගත් පියවර 3 ක් ලියන්න
(iii) ජේසුස් වහන්සේගේ ප්‍රේරිතයන් ලෙස කැඳවනු ලැබූ පහත ශ්‍රාවකයින් පිළිබඳව එක් වාක්‍යයකින් හඳුන්වන්න.
A - පිලිප් B - බර්තොලමෙව් C - තෝමස් D - ජාකොබ් E - ජුදාස් ඉස්කාරියොත්

3. (i) ජේසුස් වහන්සේ නාසරෙත් ධර්මශාලාවේදී කළ තම ප්‍රථම දේශනයේ කියවන ලද දිවැසි ග්‍රන්ථය කුමක් ද? ප්‍රථම දේශනාව සඳහන් නව ගිවිසුම් ග්‍රන්ථයක් ලියන්න.
(ii) ජේසුස් වහන්සේ තම ප්‍රථම දේශනයේ දී සඳහන් කළ පරිදි උන්වහන්සේගේ දූත කාර්යයන් 3 ක් ලියන්න.
(iii) ක්‍රිස්තුස් වහන්සේගේ ධර්මදූතවරයෙකු ලෙස ක්‍රිස්තු ඔබට සේවය කළ හැකි අවස්ථා 5 ක් ලියන්න.

4. (i) ශු. පාවුළු තුමා සඳහන් කරන පරිදි ශුද්ධාත්ම ඵල 2 ක් ලියන්න
(ii) දේව රාජ්‍යය හඳුනා නොගන්නා විට මිහිපිට මිනිසා පීඩා විඳින ක්ෂේත්‍ර 3 ක් ලියන්න
(iii) දේව මෙහෙවර උදෙසා ශුද්ධාත්ම අනුහසින් දෙව් මැදුර ආශ්‍රිතව ඔබට කළ හැකි යහපත් ක්‍රියා 5 ක් ලියන්න

5. (i) ජේසුස් වහන්සේ කළ ප්‍රාතිහාර්යයන් අතර, මළවුන් උත්ථාන කළ අවස්ථා 2 ක් ලියන්න
(ii) ජේසුස් වහන්සේගෙන් සුවය අත්දුටු පුද්ගලයන් තිදෙනෙක් නම් කරන්න.
(iii) පහත ශ්‍රේෂ්ඨ පුද්ගල චරිත 02 ඇසුරින් එක් ජීවිත කතාවක් තෝරා ගෙන ඉන් ඔබේ ජීවිතයට ලැබෙන ආදර්ශ 5 ක් ලියන්න
ගරු මයිකල් රුද්‍රිගෝ පියතුමා හෝ සේවක සෙල්වරත්නම් තුමා

6. (i) ශු. බයිබලයේ පැරණි ගිවිසුමේ හා නව ගිවිසුමේ පොත් ගණන වෙන වෙනම ලියන්න
(ii) උත්පත්ති පොතේ අඩංගු ප්‍රධාන කතා පුවත් 03 ක් ලියන්න
(iii) සබත් දින ශුද්ධ ලෙස ගත කිරීමට ඔබට කළ හැකි දේවල් 5 ක් ලියන්න

7. (i) ආබ්‍රහම් තුමාගේ උපන් ගම හා කැඳවීම ලබන විට සිටි නගරය ලියන්න.
A - උපන් ග්‍රාමය
B - කැඳවීම ලබන විට සිටි ග්‍රාමය
(ii) ආබ්‍රහම් තුමා දෙවියන් වහන්සේගෙන් ලද පොරොන්දු 03 ක් ලියන්න
(iii) ආදි පියවරුන්ගේ ජීවිත තුළින් හඳුනා ගත හැකි පොදු ලක්ෂණ 5 ක් ලියන්න

8. පහත මාතෘකා අතුරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න. (ප්‍රධාන කරුණු 5 ක් වත් අඩංගු විය යුතුය)
(i) සමිදාණෝ මා එඬේරාණෝය
(ii) ශු. පේදුරු තුමා (iv) සාකේවුස්ගේ සිත් හැරීම (vi) නෙහෙමියාගේ නායකත්වය
(iii) ඉව්ලින් කානි තුමිය (v) ආදී පීතෘ ජාකොබ්

## තෙවන වාර පරීක්ෂණය - 2019
## ක්‍රිස්තියානි ධර්මය
## පිළිතුරු පත්‍රය

08 ශ්‍රේණිය

I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | (i) | 2. | (iv) | 3. | (ii) | 4. | (ii) | 5. | (iv) |
| 6. | (iii) | 7. | (iii) | 8. | (iv) | 9. | (ii) | 10. | (i) |
| 11. | (iv) | 12. | (i) | 13. | (iv) | 14. | (ii) | 15. | (ii) |
| 16. | (ii) | 17. | (i) | 18. | (i) | 19. | (ii) | 20. | (i) |

1. (i) ජීවන වෘක්ෂය, හොඳ නරක අවබෝධ කර ගැනීමේ ගස (ii) මුහුදේ මසුන් අහසේ පක්ෂීන් ගව මහීෂයන් වන මෘගයින්, උරගයින්
   (iii)
   * දෙවියන් වහන්සේ දුන් බුද්ධියෙන් හොඳින් ඉගෙනීම
   * හැකියා වලින් දේව රාජ්‍යය පතල කිරීම
   * නිදහස් කැමැත්ත තුළ යහපත් දේ තෝරා ගැනීම
   * පවුල, පාසල තුළ සුභාරංචි පණිවුඩය අන් අය අතරට ගෙන යාම
   * දේවස්ථානයේ සමිති සමාගම් කටයුතු වටල උනන්දුවෙන් සහභාගි වීම
   * සැම දෙනා සමඟ ප්‍රේමයෙන් ජීවත් වීම

   ආදි කරුණු සලකා බලා ලකුණු දෙන්න.

2. (i) මන්නා, වටු කුරුල්ලන්
   (ii)
   * බර වැඩ ගැනීම
   * උපදින පිරිමි දරුවන් මැරීමට නියෝග කිරීම
   * පිරිමි දරුවන් නයිල් ගඟට දැමීමට නියෝග කිරීම

   (iii)
   A - පිලිප් - පන්දහසකට කෑම දීමේ සිදුවීමේ හමුවේ
   B - බර්තොලමෙව් - පිලිප් විසින් ක්‍රිස්තුන් වහන්සේට හඳුන්වා දී ඇත.
   C - තෝමස් - උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේගේ ඇණ කැළැල් දැකීමෙන් උන්වහන්සේ අදහා ගත්තේය.
   D - අල්පෙවුස්ගේ පුත් ජාකොබ් - ලෙවිගේ සහෝදරයෙක්
   E - ජුදාස් ඉස්කාරියොත් - ක්‍රිස්තුන් වහන්සේ පාවා දුන් තැනැත්තා

03. (i) යෙසායා දිවැසිවරයා - ලූත් සුභාරංචිය
   (ii)
   * දිළිඳුන්ට සුභාරංචිය දේශනා කිරීම
   * වහලුන්ට මිදීම දීම
   * අන්ධයින්ට පෙනීම දිම
   * පීඩිත වූවන් මිදීම

   (iii) පිළිතුරු සලකා බලා ලකුණු ලබාදෙන්න.

4. (i) ප්‍රේමය, ප්‍රීතිය, සාමය, ඉවසීම, කරුණාව, යහපත්කම, විශ්වාසවන්තකම, මෘදුකම, ආත්ම දමනය
   (ii) ශාරීරික පීඩා, මානසික පීඩා, ආත්මික පීඩා
   (iii)
   * දේව මෙහෙයන් සඳහා නිතිපතා බැතියෙන් සහභාගි වීම
   * ශුද්ධාත්මයාණන් වහන්සේට බලවත් ලෙස ක්‍රියා කිරීම සඳහා දේවස්ථාන සමූහය වෙනුවෙන් නිතිපතා අයදීම
   * දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා කැපවීමට ශුද්ධාත්ම බලය අයදිමින් සාමුහිකව නොකඩවා යාච්ඤා කිරීම
   * ශුද්ධාත්මයාණන් වහන්සේට සහාව හසුරුවන්නට ඉඩ සැලසීම.
   * ඔබට ලැබෙන වගකීම ශුද්ධාත්ම සවියෙන් උද්යෝගයෙන් ඉටු කිරීම

5. (i)
   * නායිම් නුවර වැන්දඹුවගේ පුත්‍රයා මරණින් නැගිටු වීම.
   * ලාසරුස් මරණින් නැගිටුවීම
   * ජායාරුස්ගේ දියණිය මරණින් නැගිටු වීම.

   (ii)
   * මීමැස් මොර රෝගින්
   * ලාදුරු රෝගීන්
   * ගොළු බිහිරෙකුට සුවය

   ආදී කරුණු

   (iii)
   * සරල චාම් දිවි පෙවත
   * ජනතාවට ස්ව උත්සාහයෙන් නැගී සිටීමට ශක්තිය දීම
   * යහපත් ජීවිතාදර්ශය
   * එකිනෙකාට ක්‍රිස්තුන් වහන්සේ අත් දකින්නට හැකි වටපිටාවක් සකස් කර දීම
   * සමාජ සේවා
   * තම කාලය, ශ්‍රමය, මුදල් ජනතා මෙහෙවරට යෙදීම
   * එකිනෙකා සමානාත්මතාවයෙන් සැලකීම

6. (i) පැරණි ගිවිසුම - 39
   නව ගිවිසුම - 27
   (ii)
   * මිනිසා මැවීම හා පාපයට වැටීම
   * කායින් ආබෙල්, නෝව සහ ජලගැල්ම, බාබෙල් කොත
   * ආදිපියවරුන්ගේ ඇදහිල්ල
   * ජාකොබ්ගේ පරපුර මිසරයේ පදිංචියට යාම

   (iii)
   * ඉරු දින නොකඩවා දේව නමස්කාරයට සහභාගි වීම
   * ඉරු දින දේව මෙහෙය අතපසු කර බාහිර ක්‍රියාකාරකම් වල යෙදීමෙන් වැළකීම
   * උපරිම ලෙස දේව මහිමය හා අන් යහපත උදෙසා සබත් දිනය වැය කිරීම

   ආදි කරුණු

7. (i) A - ඌර් නගරය
   B - හාරාන්
   (ii)
   * ආබ්‍රහම්ට දේශයක් හිමිකර දෙන බව
   * ආබ්‍රහම්ට මහත් ජාතියක් දෙන බව
   * ආබ්‍රහම්ගේ නාමය මුළු පොළවේම සෙනඟට ආශිර්වාදිත වන බව

   (iii)
   * නිරතුරුවම දෙවියන් වහන්සේගේ පාලනයට නතු වීම
   * දෙවියන් වහන්සේ ඔවුන් සමඟ ගිවිසුම් ඇති කර ගැනීම
   * අභියෝග හමුවේ නොසැලී ඇදහිල්ලෙන් ක්‍රියා කිරීම
   * පරිත්‍යාගශීලි හා ධර්මිෂ්ඨ දිවියක් ගත කිරීම
   * අවශ්‍ය තැන හී තම වරද පිළිගෙන සමාව අයදීම හා නිවැරදි වීම
   * සහෝදර ප්‍රේමයෙන් දිවි ගෙවීම

8. (i) පිටු අංක 16,17 (iii) පිටු අංක 54,55 (v) පිටු අංක 99,95
   (ii) පිටු අංක 22,42,43,49 (iv) පිටු අංක 64,65 (vi) පිටු අංක 101 හා102